ආතුරං අසුචිං පූතිං පසස නන්දෙ සමුසසයං

අසුභාය චිතතං භාවෙහි එකග්ගං සුසමාහිතං

තතො හං අතිසංවිගගා සුත්වා ගාථා සුභාසිතා

තත්‍රට්ඨිතා විපසසනති අරහතතමපාණි"

නමුත් එය දෘශ්‍ය මාධ්‍ය භාවිතය නිසාවෙන් සාර්ථක වූවක් විය. තම සහකරු කරගැනීමට කැමැත්තෙන් සිටි නන්ද කුමරුන්ගේ පැවිද්දට ලක්වීම නිසාවෙන් ජනපද කළණියට සසුන් ගත වීමට සිදු විය. මෙම අවස්ථාව හරහා මනුෂ්‍ය ජීවිතයේ ඇතිවන ගැටලුවලට නිවැරදි වූ විසඳුම් ලබා දීමට බුදු දහමට හැකි වී ඇති බව පැහැදිලි ය. එය සරල වූවක් නොවේ. පුද්ගල සිත් සතන් සැනසීම වූ කල ඉතා අපහසු වූවක් වුවත් එය බුදුන් වහන්සේ අපූර්ව ආකාරයෙන් සිදු කළ බව පැහැදිලි වන්නකි.

එමෙන් ම ජනපද කළණිය මෙන් ම නන්ද කුමරු ද පැවිදි ජීවිතයට පත් වූයේ සිය පූර්ණ කමැත්ත ඇති නොවේ. එනිසාවෙන් මානසික ව්‍යාකූලභාවයෙන් සිටි නන්ද තෙරුන් සිවුරු හැරයාමට පවා සිතුවාර අනන්ත විය. මෙය සැල වූ බුදුරදුන් ඊට හේතු විමසන ලදි. එහි දී නන්ද තෙරුන්ගේ පිළිතුර වූයේ තමන්ට ජනපද කළණිය නිතරම සිහිවන බවත් අවසානයේ ඇය විසින් තමන්ට ඉක්මණින් පැමිණෙන ලෙස කළ ආයාචනය නිරන්තරව සිහිවන බවත් ය. මෙලෙස ජනපද කළණියගේ රුවට වහල් වූ නන්ද තෙරුන්ට බුදුන් වහන්සේ යෙදුවේ ද අපූර්ව උපක්‍රමයක් විය. බුදුන් වහන්සේ නන්ද තෙරුන් කැටුව තව්තිසා දිව්‍ය ලෝකයට වැඩීමට තීරණය කරන ලදි. ඒ යන අතරමග දී දැවීගිය හේනක පිළිස්සි ගිය වැඳිරියක දැක ඒ බව නන්ද තෙරුන්ට ද පෙන්වන ලදි. අනතුරුව දුටුවේ රූපශ්‍රීයෙන් යුතු දෙවඟනක් වේ. පසුව බුදුන් වහන්සේ විසින් නන්ද හිමිගෙන් විමසන ලද්දේ තමන්ගේ සිත ගත්තේ වැඳිරිය ද නැතිනම් දෙවඟන ද ලෙසට වේ. එහි දී බුදුන් වහන්සේට හට නන්ද තෙරුන් පැවසූයේ ජනපද කළණිය වැඳිරියට සම බවත් දෙවඟන තම සිත ගත් බවත් වේ. එසේ නම් එම දෙවඟන ලබාගනු වස් ඔබ විසින් ශාසනයේ ඇලී ගැලී වීර්ය වඩන ලෙස පවසන ලදි. එතැන් පටන් විර්ය වඩා සිත සමාධි කරගත් නන්ද හිමියන් අවසන රහත්භාවයට පත් විය. මේ අනුව අවසානයේ යථාතත්ත්වාවබෝධය ලබා ගත් නන්ද හිමියන්ට තමන්ට මීට ඉහත දී ගත කිරීමට සිදු වු ජීවිතය මුලාවක් බව වැටහුණි. ඒ බව **"විපරිත සිතැතිව සියොළඟ සැරසුවෙමි. කාමරාගයෙන් මුකුලිත වුණෙමි. අදාන්ත වූද සසල වූද සිත් අතිව වසඟ කළ උපායෙහි දක්ෂ වූ සූර්ය බන්ධු වු බුදුරදුන් කරණකොට ගෙන නුවණින් පිළිපැඳ සසරෙහි ගිලුනු සිත නගාලමි."**[27]

**"අයෝනිසො මනසිකාරා**

**මණ්ඩනං අනු යුඤ්ජිසං**

**උද්ධතො චපලො චාපි**

**කාමරාගෙන අට්ඨිතා**

**අපාය කුසලෙනාහං**

---

[27] ඛු.නි. අපදාන පාළි ථෙරී අපදාන ii, 2006, පි.62

**බුද්ධෙනාදිච්ච බන්ධූනා**

**යොනිසො පටි පජජිත්වා**

**භවේ චිත්තං උදබ්බහිනති"**

මේ අනුව බුදුන් වහන්සේ දෘශ්‍ය මාධ්‍ය ක්‍රමය මෙන් ම ත්‍යාග ලබා දීමක් සිදු කිරීමක් ද දැක ගත හැකි වේ. නන්ද තෙරුන් වහන්සේව ශාසනයේ රඳවා තබනු වස් දෙවඟනක් ලබා දීමේ පොරොන්දුව බුදුන් වහන්සේ ලබා දීම හරහා එය පැහැදිලි වන්නකි. ඒ අනුව ප්‍රදර්ශන ඉගෙනුම් ක්‍රමයේ භාවිතය මෙහි දී දක්නට හැකි වේ.

සාර්ථක ගුරුවරයෙකුට දේශන ගණනාවකින් ශිෂ්‍ය මනසට පාඩමක් ග්‍රහණය කිරීමට වඩා දෘශ්‍යාධාර හරහා කරුණු ඒත්තු ගැන්වීම වඩා ඵලදායී වන්නකි. ඒ පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත වූ බුදුරජාණන් වහන්සේ විසින් එය සමස්ත ගුරු පරපුරට ම ආදර්ශයක් වන ලෙසට විදහා දක්වා ඇති අයුරු උන්වහන්සේගේ ඇතැම් දේශනා විලාසයන් අනුව සපථ වේ. ප්‍රශ්නෘත පාඩම් හා මනා කොට බැඳී යන ආකාරයට ඒ උදෙසා භෞතික සම්පත් උපයෝගී කර ගැනීම වැදගත් වන අතර මානව සම්පත ද එහි ලා වැදගත් වේ. කිසියම් දේශනයකින් යථාර්ථය අවබෝධ කරගත නො හැකි යැයි දැනෙන ශ්‍රාවකයින් හට මනෝමය වශයෙන් කටයුතු කිරීමක් මෙහි දී වේ.

### 2.2.4 උපමා භාවිතය

බුදුන් වහන්සේගේ දේශනාවන් තුළ උපමාවට හිමි වනුයේ සුවිශේෂී ස්ථානයක් බව පැහැදිලි වන්නකි. ශ්‍රාවකයා විෂයෙහි අරුත් මනාව වටහා දීමට මෙන් ම ධර්ම සංවේගය ජනනයෙහි ලා අත්‍යවශ්‍ය අංගයක් ලෙස බුදුන් වහන්සේ උපමාව භාවිතයට ගෙන ඇති බව පෙනී යන්නකි. කවීන් විසින් කිවිසමයෙහි රසෝත්පාදක අංගයක් ලෙසත්, අලංකාරයක් එක් කරනු වස් ද උපමාව යොදා ගත් අතර බ්‍රාහ්මණ ග්‍රන්ථයන්ට අනුකූලව ද වෛදික යාගය සම්බන්ධ විවිධ ද්‍රව්‍ය උපමා භාවිතයෙන් පැහැදිලි කර ආකාරයක් දක්නට වේ. ත්‍රිපිටක සාහිත්‍යය ද උපමා සාගරයක් ලෙස දැක්වීම වරදක් නො වන්නකි. බුද්ධ දේශනාවන් සියල්ලෙහිම පාහේ උපමා ගැබ්ව පැවතීම ඊට හේතුව වේ.

උපමා භාවිතයේ ප්‍රබලත්වය තීව්‍ර වන අවස්ථාවක් ලෙසට ඇතැම් සූත්‍ර දේශනාවන් උපමාවන්හි නාමයන්ගෙන් සඳහන් ව තිබීම දැක්විය හැකි වේ. අලගද්දූපම, කකචූපම, හත්ථිපදෝපම, සාරෝපම ඊට නිදර්ශන වේ. ඇතැම් විට උපමා කිහිපයක අන්තර්ගතයක් ඇති සූත්‍ර ද හඳුනාගත හැකි වේ. සූත්‍ර වර්ගීකරණයෙහි ලා ද උපමාවන්ගේ බලපෑම සිදු වී තිබෙන්නකි. සංයුක්ත නිකායේ ඕපම්ම වර්ගය එවැන්නකි. පුෂ්ඵ වර්ගයේ සූත්‍ර දහයත්, ආසිවිසෝපම වර්ගයේ සූත්‍ර දහය තුළත්, ධම්ම පදයේ ගාථා 315 ක් තුළත් උපමාවෙහි භාවිතය ප්‍රදර්ශනය වේ.

උපමා භාවිතයට බුදුන් වහන්සේ විසින් වහල් නො වූ බවක් උන්වහන්සේගේ ක්‍රියාකලාපය අනුව පැහැදිලි වන්නකි. උපමා කතා සෑම සාහිත්‍යයකම පාහේ ඉතා ජනප්‍රිය සාහිත්‍යාංගයක් වේ. ඊසෝප්ගේ උපමා කතා, නස්රුදීන්ගේ කතා ආදිය ඊට උදාහරණ වේ. එහෙත් බුදුන් වහන්සෙගේ උපමාවන්හි විශේෂතාවය නම් උන්වහන්සේ විසින් යොදා ගත් උපමා උක්ත උපමා මෙන් මනඃකල්පිත නො වීම සඳහන් කළ හැකි වේ.

බුද්ධ දේශනාවන්හි එනු ලබන උපමාවන්හි වන තවත් සුවිශේෂීතාවයක් වනුයේ එම උපමාවන්හි ඖචිත්‍යය රඳා පවතින නිසාවෙනි. එහි ලා බලපාන හේතු සාධක ලෙස අවස්ථාවෝචිතව දේශනයට අරමුණු වන ශ්‍රාවකයාගේ මානසික මට්ටම අනුව ප්‍රස්තෘත විෂයෙහි අර්ථය මනාව කුළුගැන්වෙන ලෙස භාවිතය සඳහන් කළ හැකි වේ. විනේය ජනයා හික්මවනු වස් උපමා රූපක භාවිතය යොදා ගත් බුදුරදුන් බුදුදහමේ සංකීර්ණ ධර්ම කරුණු වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම, ත්‍රිලක්ෂණය පමණක් නොව බෞද්ධයාගේ අවසාන පරමාර්ථය වන නිවන පිළිබඳව ද උපමා භාවිතයෙන් කළ පැහැදිලි කිරීම් අනාවරණය වන්නකි.

ඇතැම් විට බුදුන් වහන්සේ උපමා උපමේය නිසි අයුරින් ගළපා ප්‍රස්තෘත විෂයෙහි ඒකාදේශයක් පමණක් උපමාරූඪ කිරීමෙන් නො නැවතී දීර්ඝ ලෙස පැහැදිලි කිරීමකට යොමු වී ඇති ආකාරයක් ද දිස් වන්නකි. චූලසාරෝපම[28], මහාසාරෝපම[29], චුල්ලහත්ථිපදෝපම[30], පහාරාද, කසීභාරද්වාජ ඊට නිදසුන් වේ.

බුදුන් වහන්සේගේ උපමාවන් භාවිතයේ වන තවත් සුවිශේෂී ගුණාංගයක් වනුයේ ශ්‍රාවකයගේ සාමාජීය, ආර්ථික, ආගමික පරිසරයට උචිත වන අයුරින් එහි භාවිතයක් දක්නට වීම යි. එනිසාවෙන් එය පිළිබඳ අවබෝධය ඔවුන් වෙත නිරායාසයෙන් ම ඇති වන්නකි. ගිහිකළ දක්ෂ වීණා වාදකයෙකුව සිටි **සෝණ කෝලිවිස තෙරුන්ට** අර්හත්භාවයට පත්වීමට දෝෂ ඇති වූ විට දී බුදුන් වහන්සේ වීර්ය සමතාවෙහි අගය දැක්වීමට වීණාවේ තත් සුසර කිරීම උපමාකොට ධර්ම දේශනයන් සිදු කළ බව සඳහන් වන්නකි.[31]

ප්‍රතිවාදියාගේ තර්ක බිඳ දැමීම සඳහාත් උපමා හේ උපමා කතා භාවිත කරන ලදි. තමන් සීසාමින් එයින් වපුරා අනුභව කරමි යි කසීභාරද්වාජ බමුණා පැවසූ ප්‍රකාශයට බුදුන් වහන්සේ විසින් තමන් ද ශ්‍රද්ධාව බිජුවට කොටගෙන, තපස වර්ෂාව ලෙසත්, ප්‍රඥාව විය ගස හා නගුල ලෙසත් ලජ්ජාව නගුලිස ලෙසත්, සිත යොත ලෙසත්, ස්මෘතිය හීවැල හා කෙවිට ලෙසත් ගෙන කෘෂිකර්මාන්තයේ නියැලෙන බව බුදුන් වහන්සේ පවසන ලද අවස්ථාව එයට උදාහරණ වේ.[32]

බුදුරජාණන් වහන්සේ විසින් භාවිත කළ උපමා රාශියක් වේ ඒ අතරින් සුප්‍රකට උපමාවන් ලෙස උපමාවන් දැකගත හැකි ය.

- කුල්ලුපමාව උපමාව
- භසත්‍රා උපමාව
- තාලවත්ථු උපමාව
- තලාක උපමාව
- ගූථ කූප අපමාව
- ගොඝාතක උපමාව

[28] ම.නි.i, 2006, පි.478-492
[29] ම.නි.i, 2006, පි.462-476
[30] ම.නි.i, 2006, පි.426-446
[31] අං නි
[32] සු.නි., 2006, පි.28-31

- මහා හත්ථිපදොපමාව
- වෙදෙහිකාවගේ උපමාව
- මධුපිණ්ඩික උපමාව
- අලගද්දූපම උපමාව
- කකචූපම උපමාව
- රථ විනීතොපමාව
- නිවාප උපමාව
- සාරොපමාව උපමාව
- උත්තරරාණි උපමාව
- සාගරොපමා උපමාව
- ගොපාලක උපමාව

ආදිලෙසට වේ. උපමාව උපමේය හා ගැළපීමේ දී "එවමෙව" යන පදය යෙදෙන ඇත. සතිපට්ඨාන සූත්‍රයේ[33] දී ශරීරය පිළිබඳ දේශනා කළ බුදුරදුන් ශරීරය හා එහි අවයව දෙකොන බඳින ලද මල්ලක ඇමූ වී, මුං, තල, මෑ ආදියට උපමා කර තිබේ. මහා සීහනාද සූත්‍රයේ[34] දී තමන් වහන්සේ සතය ගවේෂණය කරන කල්හි ගත කල කාලය පිළිබඳ උන්වහන්සේ දක්වනුයේ ඉතා සුන්දර උපමා භාවිතයකිනි. වනයෙහි නිදල්ලේ හැසිරෙන මුවෙකු මිනිසුන් දැකීමෙන් බියට පත්ව වනයෙන් වනයට, රොදිනි රොදට, පල්ලමෙන් පල්ලමට, කන්දෙන් කන්දට, පැන දුවන්නකා සේ මමත් විවේක ජීවිතයක් ගත කරන්නට කැලයට ගොස් මිනිසුන් දකිතියි සිතා ඊට බියව ගොපල්ලන්, එඬේරන්, තණකපන්නන්, දරකපන්නන් හා කැලෑ ගිනි තියන්නන් දැක කැලයෙන් කැලයට, පල්ලමෙන් දිවීම් ලෙසට පවසන ලද අවස්ථාවෙන් පෙනේ.

බුදුන් වහන්සේ විසින් කාමය පිළිබඳව ඉතා කදිම උපමාවන් භාවිත කරමිනි කළ පැහැදිලි කිරිමක් දක්නට වේ. එහි දී කාමය ඇට සැකිල්ලකට (අට්ඨී කඞකලූපමා කාමා වුතෙතා), මස්වැදැල්ලකට (සංස පෙසූපමා කාමා වුතෙතා), ගිනිහුලකට (තීනුක්කූපමා කාමා වුතෙතා), අඟුරු වලකට (අඞගාරාකාසූපමා කාමා වුතෙතා), සිහිනයකට (යූපනූපමා කාමා වුතෙතා), කඩු මුහුණතකට (අසීසූනුපමා කාමා වුතෙතා), සර්ප හිසකට (සපපසිරූපමා කාමා වුතෙතා)[35] ලෙසට උපමා කර ඇති ආකාරයෙන් ප්‍රත්‍යක්ෂ වේ.

බුදුන් වහන්සේ සතුවන තවත් සුවිශේෂී වූ ලක්ෂණයක් නම් සිය ශ්‍රාවකයින්ට ඉගැන්වීමේ දී ආරාමය, දම්සභා මණ්ඩපයට පමණක් සීමානොවී එළිමහන් ස්ථානවල දී ද දේශනාවන් සිදු කිරීම වේ. එහි දී උද්‍යාන, සුසානභූමි, ගල්තලා, රුක් සෙවන, කුඹුරු, තණපිට්ටනි, දුගී පැල්පත්, මහවනය ආදි වූ ස්ථානයන්හි දේශනා කරන ලද බොහෝ දේශනාවන් බහුල වේ. මේ අනුව එදිනෙදා ශ්‍රාවකයින්ට නෙතගැටෙන වස්තුන්ගෙන් ප්‍රයෝජනයක් ගත් අවස්ථාවන් වේ. වනයට වැඩි බුදුන්

33 දී.නි.ii, 2006, පි.436-503
34 ම.නි.i, 2006, පි.164-198
35 එම, පි.324-354

වහන්සේ තමන් වහන්සේ දේශනා කරන ලද ධර්මය එහි ගස්කොළවලින් වැටී ඇති සහ නොවැටී ඇති කොළවලට සමාන කර පෙන්වූ අවස්ථා වේ. සුසාන භූමියට වඩින බුදුන් වහන්සේ මළ සිරුරක් පෙන්වා එයින් දේශනාවන් සිදු කළේ ශ්‍රාවකයාට පූර්ණ අවබෝධයක් ලබා දීමට ම වේ.

**සිරිමා** නම් වූ සුරූපි සුප්‍රසිද්ධ ගණිකාව හදිසියේ මිය ගිය අවස්ථාවේ බුදුරදුන් විසින් රජුට පවසන් ලද්දේ රූපශ්‍රියෙන් හෙබි ඇයව ආදාහනය නො කොට සතුන්ට ළංවීමට ඉඩ නො දී ආරක්ෂා කොට තබන ලෙස වේ. අනතුරුව සතරවන දිනයෙහි නගරවාසීන් සුසාන භූමියට රැස් කොට බුදුන් වහන්සේ මෙම සුරූපිනියගේ සිරුර වෙන්දේසි කරන ලෙස රජුට පවරන ලදි. බුදුන්ගේ වදන පිළිගත් රජු එය ක්‍රියාත්මක කළත් කිසිවෙකුත් ඇයගේ මළසිරුර ලබාගැනීමට කැමති නො වීය. මසුරන් දහසෙන් පටන් ගෙන අවම වශයෙන් මසුරනකට ලබාගනීමට කැමති අයෙකු සිටී දැයි විමසුවත් කිසිවෙකුත් නො වීය. අවම වශයෙන් මුදලින් තොරවවත් ලබාගැනීමට කැමති වූවෝ නො වීය. මෙලෙස ඉදිමී දුගඳ හමමින් පුයාව වැගිරෙන සිරුර භාර ගැනීමට කිසිවෙකුත් නො වුණු එම අවස්ථාවේ බුදුන් වහන්සේ රූපයට වහල්වීමේ ආදීනව දේශනා කරන ලදි. අවස්ථාවෝචිතව උන්වහන්සේ විසින් සිදු කරන ලද දේශනයන්ට උපමාව භාවිත කළ ආකාරය ඉන් පසක් වනු ලබන්නකි.

බුදුන් වහන්සේ විසින් කරුණු අවබෝධය සඳහා බොහෝ සේ යොදා ගත්තේ නිරන්තරයෙන් පුද්ගලයාගේ ඇස ගැටෙන වස්තූන්වීම විශේෂත්වය වේ. වරෙක බුදුන් වහන්සේ ඇට්ටේරිය වනයෙහි වැඩ වසන කළෙක ඇට්ටේරිය කොළ මිටක් ගෙන භික්ෂූන් වහන්සේ අමතන ලදි. මහණෙනි කුමක් සිත්වීද? මා විසින් අතින් ගන්නා ලද ඇට්ටේරිය කොළ ප්‍රමාණය ද වැඩි වනයෙහි රුක්මතුයෙහි ඇති ඇට්ටේරිය කොල ප්‍රමාණයදැයි ඇසූහ. එවිට වනයෙහි රුක්වල ඇති ඇට්ටේරිය කොළ ප්‍රමාණය විශාල බව භික්ෂූන්ගේ අදහස් විය. එලෙසම තමන් විසින් දේශනා කරන ලද ධර්ම ප්‍රමාණයට වඩා දේශනා නො කරන ලද ප්‍රමාණය අධික බව පවසන ලදි.[36] ඒ අනුව තමන් වහන්සේ විසින් සත්ත්වයා දුකින් මුදවාලනු පිණිස දහම් දේශනා කරන ලද බව උන්වහන්සේගේ අදහස විය. බුදුන් වහන්සේ විසින් නිරන්තරයෙන් දේශනා කරන ලද්දේ පුද්ගලයාට හිතකාමී වැඩදායී ධර්ම කරුණු පමණක් විය. ඒ අනුව බුදුන් වහන්සේ නිය පිටට පස් ගෙන තමන් වහන්සේ දේශනා කරන ලද ධර්මය මෙම නියපිට ඇති පස් මෙන් වන බවත් දේශනා නො කරන ලද ධර්මය පොළවෙහි පස් මෙන් වන බවත් දක්වන ලදි. මේ අනුව බුදුන් වහන්සේ ශිෂ්‍ය කේන්ද්‍රීය වූ ඉගෙනුම් ක්‍රමයක් අනුගමනය කළ බව පැහැදිලි වන්නකි.

### 2.2.5 ස්වයං අධ්‍යනය භාවිතය

බෞද්ධ සන්නිවේදනයෙහි වන තවත් සුවිශේෂී ලක්ෂණයක් ලෙසට ශ්‍රාවකයාට ඔවුන් විසින් සිදු කරනු ලබන අධ්‍යයනයන් හරහා ම කරුණු අවබෝධයට අවස්ථාව සලසා දීමක් දැක ගත හැකි වේ. එය දේශනයකට වඩා ඔබ්බට යැමක් වන හෙයින් කරුණු අවබෝධයට පහසුවක් ඉන් ඇති වේ. යමෙකු කියා සිටින දෙයක් අසා සිට දැන ගැනීමට වඩා එය යහපත් වේ. නූතන අධ්‍යාපන ක්‍රමය තුළ ද එය භාවිත වන්නේ එහෙයිනි. ඒ අනුව පෙර සිට ම එම ක්‍රමයේ අර්ථවත් බව දැන

[36] සං.නි,. සිසාප සූත්‍රය, පි.294

හඳුනාගත්තෙකු ලෙසට ක්‍රියා කළ බුදුන් වහන්සේගේ ක්‍රියාකලාපය සමස්ත ආචාර්යවරුන්ට ම ආදර්ශයකි.

චුල්ල පන්ථක තෙරුන්ට හාරමසක් මුළුල්ලේ පාඩම් කළත් කටපාඩම් නො වුණු ධර්ම කරුණු නිසාවෙන් කළකිරී සසුනෙන් ඉවත්වීමට තීරණය කළ අවස්ථාවේ එම තරුණ භික්ෂුවට පිරිසිදු සුදු රෙදි කඩක් ලබා දී පායපු ඉර දෙස බලා දෑතින් එය පිරිනැමීමට පවසන අවස්ථාවක් වේ. එහි දී **"රජෝ හරණං රජෝ හරණං"** යැයි කියමින් සිටීම පමණක් කරන ලෙස බුදුන්ගේ අවවාදය විය. අනතුරුව එම සුදු රෙදි කඩ කිළිටි වූ ආකරය දැක එයින් යථාතත්ත්වාවබෝධය ලබා රහත් ඵලය ලැබීමට තරම් චුල්ල පන්ථක තෙරුන් භාග්‍යවන්ත විය. මෙය ස්වයං අධ්‍යනය සපථ කෙරෙන අවස්ථාවක් වේ. මෙවනි පැවරුම් අදාළ තත්ත්වයන් යටතේ පැවරීමක් උන්වහන්සේ විසින් සිදු කර තිබේ. සෑම විටම බුදුන් වහන්සේ විසින් සියල්ල දේශනා කොට ශ්‍රාවකයා හමුවේ තැබීමක් දක්නට නො වන අතර ශ්‍රාවක බුද්ධිය මතුකර ගත් අවස්ථාවන් ද වන බව සපථ වන්නකි.

ධර්ම දේශනයට පමණක් සීමා නොවුණු තවත් එක් අවස්ථාවක් ලෙසට බුදුන් වහන්සේ කිසාගෝතමීයට කරුණු අවබෝධ කළ අවස්ථාව නිදර්ශන වේ. ඉතා ධනවත් පවුලක ජන්මය ලද කිසාගෝතමියට හදිසියේ සිය පුත්‍රයාගේ මරණයට මුහුණ දීමට සිදු විය. නොයෙක් වෙදුන්ගේ උපකාර පැතුවත් පුත්‍රයාට යළි පණ ලබා ගැනීමට නො හැකි වූ ඇයට බුදුන් වහන්සේ විසින් ප්‍රතකාර සිදු කරන ලද දැන බුදුන් වහන්සේ අභිමුවට යන ලදි. ඇය කෙතරම් සිය පුත්‍රයාග් වියෝවෙන් කම්පාවට පත්වීද යත් මිය ගිය අයෙකුට යළිත් ප්‍රාණය ලබාදීමට නො හැකි බව ද ඇයට අවබෝධ නො වීය. මෙවන් පීඩාවට පත් වූ කාත්තාවකට ධර්මය දේශනාවන් ඵලක් නො වන බව වටහාගත් බුදුන් වහන්සේ උසස් මනෝවිද්‍යාඥයෙක් මෙන් කටයුතු කිරීමක් මෙහි දී දක්නට වේ. ඒ අනුව සිය පුත්‍රයා සුවපත් කරන ලෙස කළ ඇයගේ ඉල්ලීම ප්‍රතික්ෂේප නො කළ බුදුන් වහන්සේ ඒ සඳහා බෙහෙත් ලබාදීමට නම් අබ මිටක් ගෙන එන ලෙසට පවසන ලදි. පුත්‍රයා වෙනුවෙන් ඕනෑම දෙයක් කිරීමට හැකි ඇයට එය මහත් අස්වැසිල්ලක් විය.

ඇය එය අසා පිටව යෑමට කටයුතු කරන විට දී බුදුන් වහන්ස් විසින් පවසන ලද්දේ එම අබමිට කිසිවෙකුත් නො මළ ගෙදරකින් රැගෙන ආ යුතු බව යි. එයට ඇහුම්කන් දුන් ඇය සිය පුතුගේ මළ සිරුර කරපින්නාගෙන දේවරම් වෙහෙර සිට සැවැත් නුවර මහ වීදියට පිවිසි අතර හමු වූ මුල් ම නිවසින් අබ මිටක් ඉල්වන ලදි. එහි සිටි ගෘහණිය ඇයට අබ මටක් දෙන අවස්ථාවේ මේ නිවසේ කිසිකෙනුත් මිය ගොස් තිබේදැයි ලෙසට කිසාගෝතමිය විමසන ලදි. එවිට ගෘහණිය අයගේ සීයා තාත්තා සොහොයුරා ආදී වූ පිරිස් මිය ගිය බව පවසන ලදි. එවිට තමන්ට අවශ්‍ය කිසිවෙකුත් නො මළ ගෙදරකින් අබ මිටක් යැයි පවසා අය නික්ම යන ලදි. මේ අනුව මෙලෙස නිවෙස් සියයකට පමණ ගියත් ඇය කිසිවෙකුත් නො මළ නිවසක් හමු නො වීය. පසුව ඇයට ක්‍රමයෙන් සිහි බුද්ධිය මතු විය. මේ අනුව යළිත් බුදුන් හමුවට පැමිණි කිසාගෝතමිය අමතා බුදුන් වහන්සේ අබ සොයා ගත්තේදැයි විමසන ලදි. කිසාගෝතමිය එවිට පවසන ලද්දේ තමන් මරණය පිළිබඳ අවබෝධ කරගත් බවත් එනිසාවෙන් තමන්ව සංඝ සමාජයට ඇතුළත් කර ගන්නා ලෙසට ය. මේ ආකාරයෙන් යථා අවබෝධය ලබාගත් කිසාගෝතමියට පසුව රහත්ඵලය ලැබීමට තරම් හැකියාව ලැබුණි. දාරක ස්නේහයෙන් උමතුවට පත්ව යථා අවබෝධය නො මැතිව සිටි කිසාගෝතමියට බුදුන් වහන්සේ

පිහිට වූ ආකාරය යහපත් සන්නිවේදකයෙකුගේ ගුණාංගයක් වන ග්‍රාහක මට්ටම හඳුනාගත්තෙකු වන බව සපථ කරන්නකි.

බෞද්ධ සන්නිවේදන ක්‍රම ශිල්පයන් අකාලික වූවකි. ඕනෑම තරාතිරමක පසුවන පුද්ගලයන්ට කරුණු අවබෝධයට උන්වහන්සේට හැකියාව පැවතීම ද මෙහි දී පැහැදිලි වන කරුණකි. එය ස්ථානෝචිත ප්‍රඥාව යොදා ගනිමින් සිදු කරන ලද්දක් බව සනාථ වන්නේ අදාළ පුද්ගලයින්ට අනුව අවස්ථාවෝචිතව සිදු කර ඇති බැවිනි.